www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2010 මැයි දිනය

## May Day 2010

**2010 මැයි 01**

2010 මැයි දිනය පැවැත්වෙන්නේ පන්ති අරගලයේ පුනර්ජීවනයක් සිදුවන්නට යන බවට නොවරදින සලකුනු පහලව ඇති තතු තුල ය. ඉහල යන විරැකියාව ද, සෞඛ්‍ය සහ අධ්‍යාපන පහසුකම් වැනි අත්‍යවශ්‍ය සේවාවන් හදවතට ම කප්පාදු කර දැමීම ද, සේවා තත්වයන් කාබාසිනියා කිරීම ද, ඇතුලු මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එල්ල වූ ප්‍රහාරයන්ට රටක් රටක් පාසා කම්කරුවෝ මුහුන පා සිටිති. ඔවුහු පෙරලා සටන් කිරීම අරඹා ද සිටිති.

ධනවාදයේ අසාර්ථකත්වය පැහැදිලිව ප්‍රකාශිත වී පවත්නා අද දින, ලෝක කම්කරු පන්තිය ජාත්‍යන්තර සමාජවාදය උදෙසා එක්සත් විය යුතුය යන මැයි දිනයේ සාරභූත පනිවුඩය ඉතා හදිසි අවශ්‍යතාවයක් බවට පත්වී තිබේ. 2008 දී පුපුරා ගිය ගෝලීය ආර්ථික අර්බුදය 1930 ගනන්වල මහා අවපාතයේ අවතාරය යලිත් කැඳවා ඇතː ස්ථිර තත්වයක් බවට පත්ව ඇති මහා පරිමාන විරක්ෂාභාවය ද වැඩ කරන ජනතාවගේ අතිවිශාල කන්ඩායමක් දිලිඳු බවට ඇද දැමීම ද නව සහ වඩවඩාත් භයානක යුද්ධයන් කරා ඇද්දී යාම ද යලිත් සිදුවෙමින් පවතී.

2008 දී පුපුරා ගිය වෝල් වීදියේ කලබැගෑනිය, වඩාත් වසංගත තත්වයකින් දැන් ඉස්මත්තට පැමින ඇත. ලෝකය පුරා ආන්ඩු විසින් ප්‍රධාන බැංකු සහ මහා පරිමාන පෞද්ගලික ධනේශ්වර කොම්පැනි බිඳ වැටීම වැලැක්වීම උදෙසා ලෝකය පුරා ආන්ඩු දොරදන් දුන් ඩොලර් ට්‍රිලියන ගනන් දැන් රටරටවල අයවැය ලේඛනවල දැවැන්ත රාජ්‍ය නය සම්භාරයක් ලෙස සටහන් වී ඇත. ලෝකය පුරාම සෑම රටකම පාලක කන්ඩායම් මෙම තත්වයට ප්‍රතිචාර දක්වා ඇත්තේ වැඩ කරන ජනතාව කිසිසේත්ම වගකිවයුතු නැති අර්බුදයකට වන්දි ගෙවීමට එම ජනතාවට බල කිරීම මගිනි.

දැන් ප්‍රථමයෙන්ම අවධානය යොමු වී තිබෙන්නේ ග්‍රීසියට ය, එහි පැපැන්ද්‍රියෝ ආන්ඩුව තව දුරටත් වැටුප්, විශ්‍රාම වැටුප් සහ සුබසාධන සේවා කපා, වැඩ කරන ජනතාව මත බදු බර තව දුරටත් උග්‍ර කරමින් වඩාත් දරුනු අලුත් බර කන්දරාවක් පැටවීමට සූදානම් වෙමින් සිටී. දැනටමත් ස්පාඤ්ඤය සහ පෘතුගාලය මුදල් වෙලඳපලවල පීඩනයට ලක්වී තිබේ. එම තතු තුල ආර්ථික විචාරකයන් සැක සංකාවෙන් ගනන් බලන්නේ "වසංගතය" මීලඟට පැතිරෙන්නේ කොතැනට ද යන්න ය. කිසිදු රටක් මෙම අර්බුදයෙන් ගැලවී නැතː බ්‍රිතාන්‍යය, ඇමරිකා එක්සත් ජනපදය සහ ජපානය යන මේ සෑම රාජ්‍යයක්ම දැවැන්ත නය කඳුවල තර්ජනයට ලක්ව සිටිති. මතුපිටින් බැලුවොත් චීනය මින් මිදී ඇත යි පෙනී ගිය ද චීන ආන්ඩුවේ උත්තේජක වියදම් මගින් ඇති කර තිබෙන උග්‍ර උන නැගීමක් බඳු වර්ධනයේ මහා සමපේක්ෂන බුබුලු අනිවාර්යයෙන් ම පුපුරා යනු ඇත.

මෙම අභේනියෙන් ගොඩ ඒම සඳහා පාලක පන්තිය විසින් වැඩ කරන ජනතාවගෙන් උදුරා ගත යුතු වූ වටිනාකම් සම්භාරය කොතරම් ද යන්න ආර්ථික බිඳ වැටීමේ පරිමාවෙන් ම අවධාරනය කෙරේ. 2008-2009 සමයේ වැනසී ගිය ගෝලීය ධනස්කන්ධය ඩොලර් ට්‍රිලියන 25කටත් වැඩිය, එය සමස්ත ලෝක දල නිෂ්පාදිතයෙන් (ජීඩීපී) සියයට 45ක් පමන වේ.

මූල්‍ය පද්ධතියට මුක්කු ගැසීම සඳහා විවිධ ආන්ඩු කෙලින්ම කල වියදම් සමස්ත ලෝක නිෂ්පාදිතයෙන් සියයට 75ක් තරම්. මේ අනුව බලන කල දැන් ග්‍රීසියේ වැඩ කරන ජනතාවට එල්ල කර ඇති ප්‍රහාර වනාහී ධනේශ්වර ක්‍රමයේ ගෝලීය පරිමාන න්‍යාය පත්‍රය උර ගා බැලීමක් වේ.

සමාජීකෘත (මහා ධනපති සමාගම් ඒකාබද්ධ කරමින් යෝධ ප්‍රාග්ධන සම්භාරයක් යොදවා විශාල ශ්‍රමික කන්ඩායම් සූරා කමින් ගෙන යන) නිෂ්පාදනය හා පෞද්ගලික අයිතිය අතර පරස්පරය ද ගෝලීය ආර්ථිකය සහ යල්පිනූ ධනේශ්වර ජාතික රාජ්‍ය පද්ධතිය අතර පරස්පරය ද යන ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයේ අති මූලික ප්‍රතිසතිතාවෝ කාල් මාක්ස් විසින් මෙයට වසර 150කට පෙර පැහැදිලි කරන ලද්දාහ. දැන් මෙම ප්‍රතිසතිතා ආර්ථික හා දේශපාලන ජීවිතයේ මතු පිටට පුපුරා අවුත් ඇත. ගතවූ අවුරුදු 30 තුල සිදු වූ නිෂ්පාදනයේ පෙරනුවූවිරූ ජාත්‍යන්තරීකරනය විසින් තහවුරු කරනු ලැබ ඇත්තේ අර්බුදය මුල පටන් ම භූගෝල පරිමාන ස්වභාවයක් දරනු ඇති බවය.

පන්ති ආතතීහු වේගයෙන් තියුනු වෙමින් පවතිත්. වඩාත් උග්‍ර ලකුනු පහල වී ඇත්තේ ගෝලීය ධනවාදයේ හදවතේ ය - එනම් ඇමරිකා එක්සත් ජනපදයේ ය. එරට මූල්‍ය වංශාධිපති ස්ථරය දස ලක්ෂ

ගනන් ඇමරිකානුවන් ඔවන්ගේ නිවාසවලින් හා රැකියාවලින්, බොහෝ විට, වීදිවලට ඇද දමමින් පරපෝෂිත වැඩසටහන් මගින් තර වෙමින් සිටිති. ඔබාමා පාලනාධිකාරය වනාහී මෙම ගිජු ධනේශ්වර ප්‍රභූ කන්ඩායමේ දේශපාලන උපකරනය යයි එලිවීමත් සමග පුපුරා යන පන්ති සට්ටනය සඳහා කරලිය සැකසෙමින් පවතී.

එපමනක් නොව, ආර්ථික අර්බුදය විසින් ප්‍රධාන බලවත් රටවල් තල්ලු කර දමා ඇත්තේ එකිනෙකා තම ප්‍රතිමල්ලයන්ගේ වියදමෙන් පන බේරාගැනීමට උත්සාහ කිරීමට ය; එවන් තතු තුල මෙම බලවතුන් අතර අන්‍යොන්‍ය ආතතීන් උග්‍ර වෙමින් පවතී. ග්‍රීසියේ අර්බුදය දැනටම යුරෝපයේ රටවල් අතර සම්බන්ධතා දෙදරවමින් යුරෝ මුදල පමනක් නොව යුරෝපීය එකතුව පිලිබඳ මුලුමහත් ව්‍යාපෘතියම ප්‍රශ්නයට භාජන කර තිබේ. චීන බඩුවලට එරෙහිව ඉහල තීරු බදු පැනැවිය යුතු යයි දැන් ඇමරිකා එක්සත් ජනපදය තුල මතුව ඇති ඉල්ලීම් පරිපූර්න වෙලඳ යුද්ධයක් පුපුරා යාමේ තර්ජනය ඉස්මත්තට ගෙන එයි. සෑම තැනක ම ජාතික වාදයේ විසකුරු දේශපාලනය සහ සංක්‍රමනික කම්කරුවන්ට එරෙහි ජාත්‍යොත්තමවාදය යොදාගෙන වැඩ කරන ජනතාව බෙදා ලීමට ද යටින් පවත්නා පන්ති ප්‍රශ්නවලින් අවධානය ඉවතට හැරවීමට ද කටයුතු කෙරේ.

අන්තර්-අධිරාජ්‍ය ප්‍රතිමල්ලතා යුදවාදය සහ යුද්ධයේ ගිනිදැල්වලට තෙල් දමමින් තිබේ. මිලිටරි බලය යොදාගෙන තම ඓතිහාසික පරිහානිය වලක්වා ගැනීමට ඇමරිකා එක්සත් ජනපදය දරන්නා වූ උත්සාහය දැනට ම ලෝක දේශපාලනය තුලට ප්‍රගාඪ අස්ථායීකාරී බලපෑමක් ඇති කර තිබේ. "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" යන ව්‍යාජ ධජය යටතේ වොෂිංටනය මැද පෙරදිග සහ මධ්‍යම ආසියාවේ තීරනාත්මක මූලෝපායික ප්‍රදේශ යටත් කර ගැනීමට තැත් දරමින් සිටී.

ඉරාකය, ඇෆ්ගනිස්ථානය සහ පකිස්ථානය ට එරෙහිව සාපරාධී යුද්ධයක නිරතව සිටින ඇමරිකා එක්සත් ජනපදය දැන් ඉරානයට ද එරෙහිව දරුනු තර්ජනයක් එල්ල කර සිටී. දැන් පැන නැගී ඇති ගනන් නැති ප්‍රාදේශීය ගිනිදැල් ලෝක පරිමාන මහා වන්නි ජාලාවක් අවුලුවා ලීමේ හැකියාව දරා සිටී.

එහෙත් අප මෙහිදී අවධාරනය කරන කරුනක් නම් ධනවාදයේ ප්‍රතිසතිතා ම ඒවා විසඳලීමේ වෛෂයික තත්වයන් ද පහල කර ඇති බවය. මාක්ස් පැහැදිලි කල ආකාරයට, ධනවාදය එහි වර්ධනයේ ගමන් මගේදී ම තම මිනීවල හාරන්නා ද නිර්මානය කරයි. ඒ වනාහී වඩාත් ඉහල නව සමාජ ක්‍රමයක් වූ සමාජවාදය ගොඩනැගීමට සමත් කම්කරු පන්තිය යි. ගතවූ දශක තුන ඇතුලත නිෂ්පාදනයේ ගෝලීය කරනය ලෝකයේ සෑම ජාතීන්ටම අයත් කම්කරු පන්තිය පෙර නුවූ විරූ මට්ටමකින් ඒකාග්‍ර කර ඇත.

එපමනක් නොව, ධනේශ්වර සූරාකෑමේ පරිපථ තුලට කෝටි සංඛ්‍යාත චීන හා ඉන්දියානු කම්කරුවන් උකහාගැනීම මගින් ධනේශ්වර පන්තිය කෙටි කාලය තුල දී තම ලාභ වැඩි කර ගත් නමුත්, එම තතු විසින් කම්කරු පන්තියේ සමාජමය බලපෑම අති බලගතු ලෙස ශක්තිමත් කර තිබේ.

සෑම රටකම කම්කරුවන් මුහුන දී සිටින්නේ එක හා සමාන දේශපාලන බාධකයන්ට ය. ඒවා නම් විවිධ යටගිය වම්මුන් ද හිටපු රැඩිකලුන් ද එම කන්ඩායම්වල සහාය ලත් වෘත්තීය සමිති ද සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා ස්ටැලින්වාදී පක්ෂ ද වේ. ධනවාදය හංග කර දමා සමාජය සමාජවාදී පිලිවෙතක් මත යලි සැකසීමේ අරමුන ඇතිව දේශපාලන බලය අල්ලා ගැනීම සඳහා කැරෙන අරගලයක් තුලින් හැර අන් කිසි ආකාරයකින් වැඩකරන ජනතාවට සිය ඉතාම මූලික අයිතිවාසිකම් පවා ආරක්ෂා කර ගත නොහැකිව පවත්නා වත්මන් තතු තුල, ඉහත කී සියලු කන්ඩායම් කරන්නේ කම්කරු පන්තිය ධනේශ්වර රාජ්‍යයේ ඉල්ලීම්වලට යටත් කිරීම ය. මේ හෙයින් කම්කරු පන්තිය එම සියලුම පැරනි නිලධාරි තන්ත්‍ර ද ඒවායේ "වාම" හෙංචයියන්ද සමග, සට්ටනයකට අනිවාර්යයෙන්ම එලඹෙනු ඇත.

කම්කරු පන්තියේ විප්ලවවාදී විභවය ප්‍රශ්නයට භාජනය කල සියලු දෙනාට පිලිතුරු සපයමින් ලියොන් ට්‍රොට්ස්කි 1938 හතරවන ජාත්‍යන්තරයේ ආරම්භක සංක්‍රමන ක්‍රියාමාර්ගයේ මෙසේ ලියා තැබීය: "මහ ජනතාවගේ දිශානතිය ප්‍රමුඛවම තීන්දු කරනු ලබන්නේ දිරායන ධනවාදයේ වෛෂයික තතු විසිනි; දෙවනුව පැරනි කම්කරු සංවිධානවල ද්‍රෝහී දේශපාලනය බලපායි. මෙම සාධක දෙකින් සැබවින් ම, තීරනාත්මක වන්නේ පලමුවන සාධකයයි: ඉතිහාසයේ නීති නිලධාරී තන්ත්‍රයේ නීතිවලට වඩා බලගතුය."

දෙවන ලෝක යුද්ධයෙන් ඉක්බිති එලඹි ආර්ථික උත්පාතයේ දී, අලුතින් පන ගැටගසාගත් විවිධ ප්‍රතිසංස්කරනවාදී හා ස්ටැලින්වාදී තන්ත්‍ර, ඉන් සැත්තෑ වසරකට පසු දැන් එක්කෝ තව දුරටත් පවතින්නේ නැත. එසේ නැතහොත් අතිශයින් ජරාජප්ජරිතව වැනෙමින් ගාටති. එහෙත් සමාජවාදය කරා යන ගමන අනිවාර්ය වන්නේ හෝ ස්වයංක්‍රීය වන්නේ නැත. විප්ලවවාදී ක්‍රියාමාර්ගයකින් හා නායකත්වයකින් තොර වූ කල්හි අතිශයින්ම පිපුරුම් සහගත සමාජ අරගල පවා නාස්ති වී ගොස් පන්ති සතුරාට යලි අලුතින් පෙලගැසීමට ඉඩ සලසා දේශපාලන ප්‍රතිගාමිත්වයට දොර හැර දෙනු ඇත.

2010 මැයි දින, ලොව පුරා තමන්ගේ ජීවන තත්වයන් ද මූලික අයිතීන් ද රැක ගැනීමට සටන්වැද සිටින කම්කරුවන්ට හා තරුන ජනයාට *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ද හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ද තම සහෝදරාත්මක සුබ පැතුම් එවා සිටී. මෙම මුලුමහත් ග්‍රහලෝකයේ ම සමාජවාදී ජාත්‍යන්තරවාදය සඳහා සටන්වැද සිටින්නා වූත්, මැයි දිනයේ සැබෑ මූලධර්ම අන්තර්ගත කරගෙන සිටින්නා වූත් එකම දේශපාලන ව්‍යාපාරය වනාහී හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවයි. ධනවාදය විසින් නිර්මානය කර තිබෙන ව්‍යසනයන් ගෙන් එලියට මගක් සොයන කම්කරුවන් හා තරුනයන් ගෙන් අප ඉල්ලා සිටින්නේ මෙම ජාත්‍යන්තර පක්ෂයට බැඳී, ඉදිරියේ පැන නැගීමට නියමිත මහා නැගිටීම්වලට ප්‍රානසමව අවශ්‍ය විප්ලවවාදී නායකත්වය හැටියට එම පක්ෂය ගොඩනැගීමට සටන් වදින ලෙස ය.

පීටර් සිමන්ඩ්ස්

© www.wsws.org